161997
CL
2001/08/28
.. b - 3000L

# දැඩිමුණ්ඩ දෙවියන් හෙවත් අලුත්නුවර දේවතා බණ්ඩාර දෙවියන් පිළිබඳ ඓතිහාසික හා මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
පශ්චාත් උපාධි පීඨයට ඉදිරිපත් කරනු ලබන
පර්යේෂණ නිබන්ධය.

161997

1998

අධ්‍යයනාංශය- සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය

සුනිල් රම්‍යලතා රූපස්සර
එ - 16433

# පිදුම

මා වෙනුවෙන් ජීවත් වී
මගේ නැණ ගුණ දැක
සැනසී..........
දෙනෙත් පියාගත්
සදාදරණීය අම්මාටත්..........
සිව්බඹ විහරණයෙන්
මා වෙනුවෙන් ජීවත් වන
සදාදරණීය තාත්තාටත්
අනන්ත සෙනෙහසින්
පිදේ

## උපදේශකවරයාගේ /වරුන්ගේ සහතිකය.

අපේක්ෂකයා විසින් ඉහත දක්වන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මෙම නිබන්ධය ඇගයීම සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීම සුදුසු බවත්, නිර්දේශ කර සිටිමු.

01. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම්. 2/3/99

02. මහාචාර්ය මුදියන්සේ දිසානායක. 2/3/99

## අයදුම්කරුගේ ප්‍රකාශය.

මෙම පර්යේෂණ නිබන්ධය ශාස්ත්‍රපති (සිංහල) උපාධි පරීක්ෂණයේ අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා සකස් වූවකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාගේ සහ කැළණිය විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ නැටුම් අධ්‍යයනාංශ ප්‍රධාන මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතාගේ අධීක්ෂණය යටතේ නිබන්ධිත බවත්, මෙහි අන්තර්ගතය දත්ත සහ මූලාශ්‍ර ග්‍රන්ථ, සඟරා පරිශීලනය කිරීමෙන් හා ක්ෂේත්‍ර අධ්‍යයන මඟින් ලබා ගත් බවත් මෙය මීට ප්‍රථම කිසිදු විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

මෙයට,

අයදුම්කරු

## උපකාරානුස්මෘති

"දැඩිමුණ්ඩ" හෙවත් අලුත්නුවර දේවතා බණ්ඩාර දේව ඇදහිල්ල හා එහි විකාශනය පිළිබඳ අධ්‍යයනයක යෙදීමේ අභිරුචිය සපුරා ගැනීම සඳහා එය මගේ පශ්චාද් උපාධි මාතෘකාව වශයෙන් යොදා ගැනීමට අනුමැතිය ලබා දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨාධිපති මහාචාර්ය තිස්ස කාරියවසම්, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨාධිපති මහාචාර්ය එම්.එම්.කරුණානායක, සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්ය ධම්මික ගංගානාත් දිසානායක විද්වතුන් ගෞරව පූර්වක ව සිහිපත් කරමි.

මා ශිෂ්‍යාවක ව සිටි අවධියේ අපගේ ශාස්ත්‍රෝද්ග්‍රහණ කටයුතු සඳහා පැමිණීමෙන් පසු දැන හඳින ගත් කැලණිය විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ පුරා වසර ගණනාවක් ම අධ්‍යක්ෂවරයා ව සිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වර්තමාන වැඩ බලන උපකුලපති සහ ශාස්ත්‍ර පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් ගුරු පියාන්, මෙම විශේෂ අධ්‍යයනයේ දී ද, මගේ උපදේශකවරයා වශයෙන් කටයුතු කරමින් පර්යේෂණ කාර්යයෙහි නිවැරදි මඟ පෙන්වා දී ගැටලු සාකච්ඡා කරමින් හා සදොස් තැන් නිදොස් කර මා මෙහෙයවමින් ලබා දුන් ධෛර්යයට ගෞරවණීය කෘතවේදි ස්තූතිය පුද කරමි.

සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ නර්තන අධ්‍යයනාංශයේ දියුණුව පතා ඉමහත් පරිශ්‍රමයක් ගෙන කටයුතු කරන අතරතුර අවිවේකිභාවය නො තකා ළබැඳියාවෙන් යුතුව අවශ්‍ය උපදෙස් ලබා දෙමින් මා ධෛර්යමත් කළ මගේ දෙවැනි උපදේශක කැලණිය විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ නර්තන අධ්‍යයනාංශ ප්‍රධාන මහාචාර්ය මුදියන්සේ දිසානායක විද්වතාණන් සෙනෙහසින් යුතු ව සිහිපත් කරමි.

ශාස්ත්‍රිය කටයුතුවල දී කිසිදු පැකිලීමකින් තොර ව කවදත් අපට අත හිත දුන් කැලණිය විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කළ මහාචාර්ය ආනන්ද අබේසිරිවර්ධන විද්වතාණන් වෙතින් මෙම අධ්‍යයන කාර්යයට ද උපකාර ලද හැකි වීම මා ලැබූ භාග්‍යයක් සේ සලකන අතර ම එතුමාට මගේ ගෞරවය නිතැතින් ම හිමි වනු ඇත.

කාර්ය බහුලත්වයෙන් යුතු වුව ද, නිබන්ධ සැලැස්ම පිළියෙළ කර ගැනීමේ සිට මෙම අධ්‍යයන කටයුතු කර ගෙන යාමේ දී පැන නැඟුණු විෂයානුබද්ධ ගැටලු නිරාකරණය කොට මානව විද්‍යාත්මක හා පුරා විද්‍යාත්මක දත්ත සපයා ගැනීමට උපදෙස් ලබා දීමෙන් සහ අවශ්‍ය පොත පත සපයා දීමෙන් දැක්වූ සහාය පිළිබඳ ව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බී.ඒ.ටෙනිසන් පෙරේරා, මහාචාර්ය ටී.පී.කුලතුංග යන විද්වතුන් දෙපළ භක්ත්‍යාදරයෙන් සිහිපත් කරමි. අධ්‍යයන කාර්යයේ දී අප දිරිමත් කළ තවත් විද්වත් පිරිසක් ද වූහ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සුනිල් ආරියරත්න, මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර, මහාචාර්ය ආනන්ද ගුණසිංහ, ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර, කථිකාචාර්ය රත්නසිරි අරංගල, සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ ආචාර්ය පණ්ඩිත කේ.බී.ඒ.එඩ්මන්ඩ් සහ කැලණිය විශ්වවිද්‍යාලයේ පුරා විද්‍යා අධ්‍යයනාංශයේ කථිකාචාර්ය උදානි හේවගේ යන විද්වත් හිතෛෂීන් මෙහි ලා ගෞරවයෙන් සිහිපත් කරමි.

මෙම කාර්යයෙහි දී නන් අයුරින් උපකාරී වූ සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ගාමිණී ජයසූරිය මහත්මා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ඩී.වී.රාජපක්ෂ මිය , කමනී ස්වතන්ත්‍රි මහත්මිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් අතිශයින් කෘතඥ වෙමි.

පශ්චාද් උපාධි අධ්‍යයන කටයුතු වහ වහා සපුරා ගන්නැ යි පොළඹවමින් මෙම අධ්‍යයන කාර්යයෙහි දී මා ධෛර්යමත් කළ දයාබර සීතා කාරියවසම් මහත්මිය සහ හදවතින් ම උපකාරි වූ ස්ටෙලා දන්දෙණිය මහත්මියත්, තිලකා අමරසිංහ සොහොයුරියත්, කෘත ගුණ පූර්වක ව මෙහි ලා සිහිපත් කරමි.

මේ හැර මෙම පර්යේෂණ කාර්යය ආරම්භයේ පටන් නන් අයුරින් මට උපකාර කළෝ රාශියක් ද වෙති. මෙහි ලා දිගු නම් වැලක් ඇතුළත් කළ නො හැකි නමුත්, කිහිප දෙනෙකු පිළිබඳ ව අත්‍යවශ්‍යයෙන් ම සඳහන් කිරීම මගේ යුතුකම යැයි හැඟේ. දැඩිමුණ්ඩ දේව ඇදහිල්ල පිළිබඳ ව විවිධ තොරතුරු සැපයූ බස්නායක නිළමේ දිසා අතුරුපාත, අලුත්නුවර දේවාලයේ විදියගෙදර කපු පරම්පරාවේ දම්සිරි කරුණාරත්න, කරගම්පිටිගොඩ කපු පරම්පරාවේ ජයරත්න දිසානායක, යන ප්‍රධාන කපු මහත්වරුන් ඇතුළු සහෝදර කපු පිරිස සහ කාර්ය මණ්ඩලයටත්, පාරම්පරික නැටුම් ශිල්පී කටිකාචාර්ය එස්. බී. පෙත්තකෝන්, ඩබ්. එඩ්වින්, එලගල්ලේ එස්. ගුණපාල, හොලොම්බුවේ ජී. කේ. උක්කුබණ්ඩා, වැලිපැන්න, මාවතගොඩ විල්සන් ජයනෙත්ති, වේරහැර චන්ද්‍රසේන කපු මහතා, ශගුල දේවාලයේ ඩයස් කපු මහතා, නන් අයුරින් උපකාර කළ සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ ආචාර්ය මණ්ඩලය සහ මෙඩේරිගම බණ්ඩාර යුවල මෙහිලා කෘතවේදී ව සිහිපත් කරමි.

පුස්තකාල පරිහරණයේ දී කොළඹ ජාතික කෞතුකාගාරය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පුස්තකාලය, සෞන්දර්ය අධ්‍යයන ආයතනය පුස්තකාලය, සිංහල ශබ්දකෝෂ කාර්යාලය පුස්තකාලය, හා පුරා විද්‍යා දෙපාර්තමේන්තුව පුස්තකාලය වැනි ආයතනවල සියලුම පුස්තකාලයාධිපතිවරුන් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, අත් පිටපත යතුරුලියනය කර දුන් ඩී. පී. ලොකුගමගේ, ශ්‍රීනිකා මාපලගම, සහ සරෝජා දිසානායක යන අය ද, තම කටයුත්තක් සේ සලකා අවසාන පිටපත යුහුව යතුරුලියනය කර දුන් වයඹ මණ්ඩපයේ [illegible] දිසානායක හා දර්ශනීය ලෙස නිබන්ධය බැඳීමේ කාර්යය ඉටු කළ ජිනදාස සිටුගේ මහතාටත් මගේ කෘතඥතාව පිරිනමමි.

ක්ෂේත්‍ර අධ්‍යයනයේ තොරතුරු සැපයූ අදාළ ගම්වල වැසියන්ට සහ නන් අයුරින් උපකාර කළ ඒ.ඇම්. විමලරත්න මහතා ඇතුළු සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ රංජිත් වර්ණසූරිය, එස්.ඒ.විමලවීර, ලසන්ත චන්දිමාල්, ඉන්ද්‍රජිත් වැවලගේ,යමුනා උස්වත්ත, යු. දිල්රුක්ෂි, නලින් වසන්ත සියඹලාපිටිය, මුදිතා ගයානි යන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද හදවතින් ම තුති පුදමි.

මෙම අධ්‍යයන කාර්යයෙහි යෙදුණු කාලය තුළ බිරියක හා මවක වශයෙන් මගෙන් අතපසු වූ යුතුකම් විඳ දරා ගනිමින් මට ධෛර්යය දුන් දයාබර ධනේ සහ පුතු පත්මිල දෙදෙනාට හද පත්ලෙන් නැඟෙන ප්‍රශංසාව නිතැතින් ම හිමි විය යුතු ය.

අනුක්‍රමණිකා


පිටු අංක

පිදුම

උපකාරානුස්මෘති

හැඳින්වීම :: :: :: :: I – IV

සංකේත සූචිය :: :: :: :: V

ක්‍රමවේදය හා මූලාශ්‍ර :: :: :: VI – XV

1වන පරිච්ඡේදය

ශ්‍රී ලංකාවේ දේව මණ්ඩල හා දැඩිමුණ්ඩ දෙවියෝ

1.1. ප්‍රාග් – බෞද්ධ ලංකාවේ ඇදහිලි හා විශ්වාස 01 – 03

1.2. දේව මණ්ඩලයේ වර්ධනය :: :: 04 – 13

1.3. ශ්‍රී ලාංකික බෞද්ධ සමාජයේ සර්ව – දේව මණ්ඩලය :: :: :: 14 – 21

1.4. සර්ව දේව මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය :: 22 – 25

1.5. වරම් සංකල්පය :: :: :: 25 – 29

1.6. බණ්ඩාර දෙවිවරුන් අතර දැඩිමුණ්ඩ – (දේවතා බණ්ඩාර) දෙවියෝ :: :: 30 – 35

1.7. ශාන්තිකර්ම තුළ දේවමණ්ඩල හා දැඩිමුණ්ඩ දෙවියෝ :: :: :: 36 – 40

1.7.1. දෙවියන් උදෙසා පවත්වනු ලබන – ශාන්තිකර්ම තුළ දැඩිමුණ්ඩ දෙවියෝ 41 – 56

1.7.2. යකුන් උදෙසා පවත්වන ශාන්තිකර්ම තුළ දැඩිමුණ්ඩ දෙවියෝ :: :: 57 – 64

1.7.3. ග්‍රහයින් උදෙසා පවත්වන ශාන්තිකර්ම තුළ දැඩිමුණ්ඩ දෙවියෝ :: :: 64 – 70

පිටු අංක

## 2 වන පරිච්ඡේදය

දැඩිමුණ්ඩ දේව සංකල්පයේ ප්‍රභවය හා විකාශනය


2.1. දැඩිමුණ්ඩ සංකල්පයේ ප්‍රභවය හා බෞද්ධ- මුහුණුවර :: :: :: :: 71 - 83

2.2. දැඩිමුණ්ඩ දේව ඇදහිල්ලේ විකාශනය පිළිබඳ- සමීක්ෂණයට අදාළ තොරතුරු :: :: 84 - 87

2.2.1. අලුත්නුවර :: :: 87 - 88

2.2.2. මාවෙල :: :: :: 89 - 91

2.2.3. මෙඬේරිගම :: :: 91 - 92

2.2.4. තාරංගම්මත :: :: 93 - 95

2.2.5. හොලොම්බුව :: :: 95 - 96

2.3. සමීක්ෂණය පිළිබඳ විග්‍රහය :: :: 97 - 98

2.4. දැඩිමුණ්ඩ දෙවියන් පිළිබඳ තෝරාගත් ගම්වල- ජනයාගේ දැනුම හා විශ්වාස :: ::

2.4.1. දැඩිමුණ්ඩ දෙවියන්ගේ බලපරාක්‍රමය- පිළිබඳ දැනුම :: :: 99 - 102

2.4.2. අධ්‍යයනයට ලක් කර ඇති ප්‍රදේශයේ දෙවිවරු අතර දැඩිමුණ්ඩ දෙවියන්ට හිමි ස්ථානය :: :: 102 - 105

2.4.3. දැඩිමුණ්ඩ දෙවි පිහිට පතා භාරවීම 106 - 110

2.4.4. භාර ඔප්පු කිරීම හා භාවිත පූජා ද්‍රව්‍ය 111 - 116

2.4.5. ගෘහ ආශ්‍රිත පුද පූජා :: 117 - 120

2.5. දැඩිමුණ්ඩ දෙවියන් උදෙසා පර්යාය නම් :: 121 - 124

2.6. දැඩිමුණ්ඩ දෙවියන් පුද ලබන වෙනත් ස්ථාන 125 - 126

පිටු අංක

3 වන පරිච්ඡේදය

අලුත්නුවර දේවාලය


3.1. පිහිටීම :: :: :: :: 127 - 128

3.2. භෞගෝලීය ලක්ෂණ :: :: :: 128 - 130

3.3. පුරා විද්‍යාත්මක සාධක :: :: 130 - 133

3.4. ඓතිහාසික තොරතුරු

3.4.1. අලුත්නුවර උපුල්වන් දේවාලයේ ප්‍රභවය 133 - 138

3.4.2. දේවාලය ඉදිකිරීම :: :: 138 - 145

3.5. උපුල්වන් දෙවියන් යටපත් වී විෂ්ණු දෙවියන් - බලවත් වීම :: :: :: 145 - 150

3.6. විෂ්ණු දෙවි රුව මහනුවරට වැඩමවීම :: 151 - 155

3.7. අලුත්නුවර දේවාලයෙහි 'දැඩිමුණ්ඩ දෙවි' - බලවත්වීම :: :: :: 155 - 158


4 වන පරිච්ඡේදය

දේවාලයේ පාලන කටයුතු, භූමි සැලැස්ම, ගොඩනැගිලිවල වාස්තු-විද්‍යාත්මක ලක්ෂණ හා වෙනත් ඓතිහාසික ස්ථාන :


4.1. පාලන කටයුතු

4.1.1. බස්නායක නිළමේ සතු කාර්ය භාරය 159 - 161

4.1.2. රාජකාරිය හා සම්බන්ධ නිලතල

4.1.2.1. කපු පරම්පරා :: 161 - 163

4.1.2.2. විදානෙ රාළ :: 163 - 164

4.1.2.3. ආරච්චි රාළ :: 164 - 165

4.1.2.4. මුරුතැන් රාළ :: 165 - 166

4.1.2.5. වත්තකූ රාළ :: 166 - 167

4.1.2.6. පනික්කල :: :: 167 - 168

පිටු අංක


4.1.3. දේවාලයේ ආදායම් පරිහරණය 169 - 172

4.2. දේවාලය භූමියේ සැලැස්ම :: :: 173 - 176

4.3. දේවාලය ගොඩනැඟිල්ලේ බිම් සැලැස්ම :: 177 - 179

4.4. ගොඩනැඟිලිවල වාස්තු විද්‍යාත්මක අගය ::

4.4.1 දේවාලය ගොඩනැගිල්ලේ වාස්තු - විද්‍යාත්මක අගය :: :: 180 - 181

4.4.2 විශේෂ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ

4.4.2.1. වහලය :: :: 181

4.4.2.2. බාල්ක හා මුට්ටු :: 182

4.4.2.3. පරාල හා අලංකරණ 182 - 183

4.4.2.4. අක්දෙරි :: 183

4.4.2.5. උලුවහු දොරවල් හා අගුල් 183 - 184

4.4.3 වැඩසිටි දේවාලය හෙවත් පැරණි - දේවාලය :: :: :: 185

4.4.4 දඬු මඩුව :: :: :: 186 - 187

4.4.5 අම්බලමෙහි වාස්තු විද්‍යාත්මක අගය 188

4.4.6 වලව්ව හෙවත් බස්නායක නිල නිවසෙහි - වාස්තු විද්‍යාත්මක ලක්ෂණ :: 189 - 190

4.5. අලුත්නුවර දේවාලය හා සම්බන්ධ වෙනත් - ඓතිහාසික ස්ථාන :: :: :: 191 - 193


5 වන පරිච්ඡේදය

අලුත්නුවර දේවාලයේ දෛනික තේවාව සහ වාර්ෂික මංගල්‍යය


5.1. තේවාව

5.1.1 දිනපතා තේවාව :: :: 194 - 195

5.1.2 අලුයම් ධූරය :: :: 195

පිටු අංක


| | | |
|---|---|---|
| 5.1.3 | හැන්දෑ ධූරය | 196 |
| 5.1.4 | කෙම්මුර බෙර වැයීම | 196 |
| 5.2 | මුරුතැන් පූජාව | 197 - 201 |
| 5.3 | වාර්ෂික මංගල්‍යය | |
| 5.3.1 | අලුත් සහල් මංගල්‍යය | 202 - 208 |
| 5.3.2 | තානුමුර මංගල්‍යය | 209 - 210 |
| 5.3.3 | කාර්තික මංගල්‍යය | 211 - 212 |
| 5.4 | වාර්ෂික පෙරහැර මංගල්‍යය | 213 |
| 5.4.1 | නැකත් පිළියෙල කිරීම | 213 - 214 |
| 5.4.2 | 1995 වාර්ෂික ඇසළ පෙරහැර - පිළිවෙල | 215 - 216 |
| 5.4.3 | මලුව ගෙවැඩීම | 217 - 222 |
| 5.4.4 | රත් ආයුධය එසවීම | 223 - 224 |
| 5.4.5 | දේවාලය ඇතුළත පෙරහැර | 225 - 226 |
| 5.4.6 | දඬු මඩුව වටේ පෙරහැර | 226 - 227 |
| 5.4.7 | කුඹල් පෙරහැර | 227 - 229 |
| 5.4.8 | විශේෂ පෙරහැර | 230 - 235 |
| 5.4.9 | වීථි පෙරහැර | 236 |
| 5.4.9.1 | පෙරහැර ගමන් මාර්ගය | 236 - 237 |
| 5.4.9.2 | දේවාභරණ පත්තිරිප්පුව - වැඩමවීම | 237 - 238 |
| 5.4.9.3 | අවසන් මහා පෙරහැර | 239 - 241 |
| 5.4.9.4 | දහවල් අවසන් පෙරහැර | 241 - 246 |
| 5.4.10 | දේවාලය පෙරහැර හා සම්බන්ධ වත-විහාර පෙරහැර | 246 - 250 |
| 5.4.11 | දෙවියන් දැකීම | 251 - 254 |

පිටු අංක


5.4.12 කිරි ආහාර පූජාව :: :: 255

5.4.13 ගිනි පෑගීම :: :: 256 - 257

5.4.14 පෙරහැර පාළු හැන්දෑ ධූරය :: 257 - 258

නිගමනය :: :: :: :: :: 259 - 264

උපග්‍රන්ථ 01 ( සිතියම් ) :: :: :: 265 - 269

උපග්‍රන්ථ 02 ( සැලසුම් සටහන් ) :: :: 270 - 283

උපග්‍රන්ථ 03 ( සෙල් ලිපි ) :: :: 284 - 286

උපග්‍රන්ථ 04 ( චිත්‍රාවලිය ) :: :: 287 - 294

උපග්‍රන්ථ 05 ( ඡායාරූපාවලිය ) :: :: 295 - 324

උපග්‍රන්ථ 06 ( කාව්‍යාවලිය ) :: :: 325 - 371

ආශ්‍රිත ග්‍රන්ථාවලිය :: :: :: :: 372 - 382

සූචිය :: :: :: :: :: 383 - 385


❖❖❖❖❖❖❖❖❖❖❖❖

## හැඳින්වීම

ප්‍රාග් – බෞද්ධ ලාංකික සමාජයෙහි පැවැති ඇදහිලි හා විශ්වාස බුදු සමය එළඹීමෙන් පසු වුව ද සම්පූර්ණයෙන් අභාවයට නො ගොස් බෞද්ධාගමික සංකල්පයන්ට ගැළපෙන පරිදි නවීකරණය වෙමින් බෞද්ධාගමික දෙවිවරුන්ගෙන් සමන්විත දේව ධුරාවලියක් නිර්මාණය වීම දක්වා වර්ධනය වී ඇති අයුරු මෙම අධ්‍යයනයෙන් අනාවරණය කර ගැනීමට අපට හැකි විය. බෞද්ධාගමික මූලාරම්භයට පෙර සිටියා වූ දෙවිවරුන් බෞද්ධාගමෙහි විශේෂ අවස්ථා සඳහා ගළපා ගන්නා ලද දෙවිවරුන් සහ බෞද්ධාගම විසින් නිර්මාණය කරන ලද දෙවිවරුන්ගෙන් මෙම දේව ධුරාවලිය සමන්විත ය. බුද්ධ දේශනාවෙන් ලෞකික හා ලෝකෝත්තර අභිවෘද්ධිය සැලසෙන බවට විශ්වාසයක් බෞද්ධ සමාජය තුළ ගොඩ නැඟී පැවැති නමුත් කෙටි කාලයක් තුළ ලෞකික දියුණුවක් ලබා දීම සඳහා ඍජු දායකත්වයක් දිය හැකි වන්නේ බුදුන් වහන්සේට නො ව මහානුභාව සම්පන්න බලයක් ඇති දෙවිවරුන්ට යැයි විශ්වාස කළ මිනිසා පින් අනුමෝදන් කිරීමෙන් දේවාශිර්වාදය ලබා දියුණුව සලසා ගැනීමේ අභිලාෂය ඇති ව දෙවියන් ඇදහීමට වඩවඩාත් නැඹුරු විය හැකි බව පෙනේ.

මේ නිසා ම සිංහල බෞද්ධයින් අතර පැවැති දේව විශ්වාස යුගයෙන් යුගයට වෙනස් වෙමින් පැවැති අයුරු සහ ප්‍රාග් – ඓතිහාසික අවධියේ ස්වදේශීය ජන්මයක් ඇති ව සිටි දෙවිවරුන් , භාරතීය හින්දු සම්ප්‍රදායයෙන් පැමිණි දෙවිවරුන්, බුදු සමය තුළින් දේවත්වයට පත්වූ දෙවිවරුන්, සංක්‍රමණිකයින් වශයෙන් දේවත්වයට පත්වූ දෙවිවරුන්, පශ්චාත් කාලීන ව දෙවියන් වශයෙන් සැලකූ බණ්ඩාර දෙවිවරුන් ඇතුළු අවශේෂ දේව කොට්ඨාසයකගෙන් ද සමන්විත සර්ව දේවමණ්ඩලයක් බුදුන් වහන්සේ යටතෙහි සිටිමින් ශ්‍රී ලාංකික බෞද්ධ සමාජයේ ක්‍රියාත්මක වන අයුරු පැහැදිලි ලෙස පෙන්වා දීමට අපට හැකි විය.